# මජ්ඣිම නිකායේ ඕපම්ම වග්ගයේ උපමා භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

මැදවච්චියේ සංඝානන්ද හිමි


## Abstract

The aim of this study is to demonstrate on the similes usaged in the Opammavagga of Majjhima Nikaya. Relating to the particular explanation, the similes provide an extraordinary influence to grasp something easy for the reader, as well as for the listener; therefore, the research problem was referred into a particular aspect, and was; how does the efficacy of similes contribute to grasp the meaning of the discourses represented in the Opammavagga of Majjhima Nikaya? Data obtained from primary and secondary sources are analyzed under qualitative analysis methods. The reader of this study will come away with a clear understanding of the essence of the discourses, and the utility of similes as follows: the spreading of loving-kindness towards all kinds of being are unique in Buddhism. If someone can spread loving-kindness even for his enemies, when they torture to him with the saw, he has reached to the ultimate range if his kindness and also he is rendered the one who follows the Buddha's instructions. The wisdom comes with the proffer understanding of the Buddha's doctrines likely one who grasps the snake rightly. The fruition of the recluse's holy life is to attain 88 the complete Enlightenment likely one who is searching for heartwood, finds with the heartwood. All wholesome states include with the Four Noble Truths likely the feet of all kinds of beings can be included in the elephant's foot. Thus, the pragmatisms of the similes represented in the discourses of the Opammavagga of Majjhima Nikaya are immeasurable.

**Key-words:** Majjhima Nikaya, Opammavagga, Similes, the Buddha, Bhikkhu

**ප්‍රමුඛ පදඃ** මජ්ඣිම නිකාය, ඕපම්ම වග්ග, උපමා, බුදුන් වහන්සේ, භික්ෂූන් වහන්සේ

**හැඳින්වීම**

ථේරවාද පාලි ත්‍රිපිටකයට අයත් දෙවෙනි කෘතිය වන මජ්ඣිම නිකාය ප්‍රමාණයෙන් මධ්‍යම වන සූත්‍ර 152කින් සංගෘහිත නිකාය ග්‍රන්ථයකි. මෙහි මූල පණ්ණාසක, මජ්ඣිම පණ්ණාසක, උපරි පණ්ණාසක යනුවෙන් පණ්ණාසක 3ක් දක්නට ලැබෙන අතර, එක් පණ්ණාසකයකට සූත්‍ර 50 බැගින් අන්තර්ගත වී ඇත. සැම පණ්ණාසකයක් ම වග්ග 5කින් සමන්විත වන අතර, එක් වග්ගයකට අන්තර්ගත සූත්‍ර ප්‍රමාණය වනුයේ 10කි. නමුත් උපරි පණ්ණාසකයේ විභංග වග්ගයේ පමණක් සූත්‍ර 12ක් දැක ගත හැකි ය. මජ්ඣිම නිකායට සපයා ඇති අටුවාව වන්නේ පපඤ්චසූදනී අට්ඨකථාව යි. අටුවාචාරී බුද්ධඝෝෂ හිමියන් අට්ඨකථාවේ දී සඳහන් කරන්නේ මජ්ඣිම නිකායෙහි පද අසූදහස් පන්සිය විසි තුනක් ද, අක්ෂර හත්ලක්ෂ හතලිස්දහස් පනස් තුනක් ද, බණවර අසූවක් ද අන්තර්ගත වන බව යි. පරවාද මථනය හෙවත් අන්‍ය ලබ්ධිකයන්ගේ මතවාද ඛණ්ඩනය කිරීම මජ්ඣිම නිකායේ මූලික උපයෝගිතාවය බව බුද්ධඝෝෂ හිමියන් විසින් කරන ලද ප්‍රකාශය ථේරවාද සම්ප්‍රදාය විසින් ද පිළිගෙන ඇත.

මජ්ඣිමපමාණ සුත්තඞ්කිතස්ස ඉධ මජ්ඣිමාගමවරස්ස,

බුද්ධානුබුද්ධසංවණ්ණිතස්ස පරවාදමථනස්ස (**ධම්මානන්ද හිමි, 2009**: 1).

මජ්ඣිම නිකායේ සූත්‍රවලින් ද බුද්ධකාලීන සමාජ සංස්කෘතික තොරතුරු හඳුනාගත හැකි වුවත් එහි මුඛ්‍යතාව යොමුවන්නේ දාර්ශනික විවරණ කෙරෙහි ය. බුද්ධඝෝෂ හිමියන් මජ්ඣිම නිකායේ ප්‍රමුඛ ලක්ෂණය පරවාද මත ඛණ්ඩනය බව පවසා ඇත්තේ මෙම කරුණු සළකා විය හැකි ය. ත්‍රිලක්ෂණය, පුනර්භවය, පටිච්චසමුප්පාදය, සත්‍යය, ධ්‍යාන, මාර්ග, ඵල සමාපත්ති වැනි බුදුදහමේ මූලික ඉගැන්වීම්

මෙන් ම ආභිධර්මික විග්‍රහ තුළින් විකාශයට පත් චිත්ත, චෛතසික, නාමරූප ධර්ම, සමාධි, විඤ්ඤාණ, චෙතොවිමුත්ති ආදි විවරණ මෙම සූත්‍රවල දක්නට ලැබේ. සමයාන්තර ඉගැන්වීම්වලින් පිරිසිදු ස්ථවිරවාදී සම්ප්‍රදායට අයත් ඉගැන්වීම් හඳුනා ගැනීමට මජ්ඣිම නිකායෙන් ලැබෙන පිටුවහල අනල්ප වේ. ඇතැම් සූත්‍රවල විවරණ ක්‍රමය අතිශය විචිත්‍ර ය. යම් යම් ධර්ම කරුණු විග්‍රහ කිරීමේ දී අටුවාවක ස්වරූපය ගත් අවස්ථා ද දක්නට ලැබේ. ප්‍රථම සංගීතයේ දී මජ්ඣිම නිකාය ආරක්ෂා කිරීම සඳහා පවරන ලද්දේ සැරියුත් හිමියන්ගේ ශිෂ්‍ය පිරිසට ය. (**ධම්මානන්ද හිමි, 2009: IV**).

මජ්ඣිම නිකාය අතිශය සිත්ගන්නා සුලු කෘතියක් වන්නේ එහි අන්තර්ගතය ගැඹුරු ධර්ම පදාර්ථ සමඟ සම්බන්ධයක් දක්වන නිසා ම නො වේ. මෙහි සූත්‍රවල අන්තර්ගතය විවිධ තේමාවන් සමඟ බැඳෙන නිසා ද වේ. ජීව විද්‍යාව, සමාජ විද්‍යාව, මනෝ විද්‍යාව, තර්කය, වීමංසාව, ඉතිහාසය, සෞන්දර්යය, විනය, අභිධර්මය ආදී අනේකවිධ තේමාවලට අදාළ ඉගැන්වීම් මෙහි විද්‍යමාන වේ. (එම, VI). මීට අමතර ව ධර්මය පහසුවෙන් අවබෝධ කර ගැනීමෙහි ලා බාහිර සමාජයේ සිදු වීම් උපමාවට ගනිමින් ගැඹුරු ධර්ම කරුණු ශ්‍රාවකයන්ට අවබෝධ කරලීමට බුදුන් වහන්සේ ගත් උත්සාහය ඕපම්ම වග්ගයෙන් පිළිඹිබු වේ. මෙම පර්යේෂණය සිදු කරනු ලබන්නේ ද මජ්ඣිම නිකායේ ඕපම්ම වග්ගයේ උපමා භාවිතය පිළිබඳ ව ය.

බුදුන් වහන්සේගේ දේශනාවන් තුළ උපමාවට හිමිවනුයේ සුවිශේෂී තැනක් බව සුප්‍රකට කරුණකි. ශ්‍රාවකයා විෂයෙහි අරුත් මනාව වටහා දිමට මෙන් ම ධර්ම සංවේගය ජනනයෙහි ලා අත්‍යවශ්‍ය අංගයක් ලෙස බුදුන් වහන්සේ තම දේශනාවන් තුළ උපමාව භාවිතයට ගෙන ඇති බව පෙනී යන්නකි. බුදුන් වහන්සේගේ උපමා සහිත දේශනාවන් ශ්‍රවණය කිරීමට කැමති වූ පුද්ගලයෙක් ලෙස උපාලි ගෘහපතියා හැඳින්විය හැකි ය. කවීන් විසින් කිවිසමයේ රසෝත්පාදක අංගයක් ලෙසත්, අලංකාරයක් එක් කරනු වස් ද උපමාව යොදා ගත් අතර, බ්‍රාහ්මණ ග්‍රන්ථයන්ට අනුකූලව ද වෛදික යාගය සම්බන්ධ විවිධ ද්‍රව්‍ය උපමා භාවිතයෙන් පැහැදිලි කර ඇති ආකාරයක් වෛදික ග්‍රන්ථයන් පරිශීලනය කිරීමෙන් දැක ගත හැකි ය. ත්‍රිපිටක සාහිත්‍ය ද උපමා සාගරයක් ලෙස දැක්වීම වරදක් නො වේ. මජ්ඣිම නිකායේ ඕපම්ම වග්ගය වනාහි එබඳු උපමාවන්ගෙන් සුපෝෂිත වූ වග්ගයකි.

බුදුන් වහන්සේගේ උපමා භාවිතය තීව්‍ර වන අවස්ථාවක් ලෙසට ඇතැම් සූත්‍ර දේශනාවන් උපමාවන්හි නාමයන්ගෙන් සඳහන් ව තිබීම දැක් විය හැකි වේ. කකචූපම, අලගද්දූපම, හත්ථිපදෝපම, සාරෝපම ඊට නිදසුන් වශයෙන් පෙන්වා දිය හැක. ඇතැම් විට උපමා කිහිපයක අන්තර්ගතයක් ඇති සූත්‍ර ද හඳුනාගත හැකි වේ. සූත්‍ර වර්ගීකරණයෙහි ලා උපමාවන්ගේ බලපෑම සිදු වී තිබෙන්නෙකි. මජ්ඣිම නිකායේ ඕපම්ම වග්ගය ඊට නිදර්ශනයක් ලෙස පෙන්වා දිය හැකි ය. ඒ අනුව මෙම පර්යේෂණ පත්‍රයෙන් සිදු කෙරෙනු ලැබෙන්නේ මජ්ඣිම නිකායේ ඕපම්ම වග්ගයේ ඇතුළත් සූත්‍ර 10 ඇති උපමා භාවිතය පිළිබඳ ව විමර්ශනාත්මක ව අධ්‍යයනය කිරීම යි.

**සාහිත්‍ය විමර්ශන**

මජ්ඣිම නිකායේ ඕපම්ම වග්ගයේ උපමා භාවිතය පිළිබඳ රචනා වී ඇති පර්යේෂණ පත්‍රයන් කිහිපයක් දැක ගත හැකි ය. ඒ අතරින් මහාචාර්ය පූජ්‍ය දේවාලේගම මේධානන්ද හිමියන් විසින් විවිධ ශාස්ත්‍රීය සඟරාවන් සඳහා රචිත පර්යේෂණ ලිපි එකතු කොට සංග්‍රහ කරන ලද බෞද්ධ අධ්‍යයන ලිපි නම් කෘතියේ 18 වන පරිච්ඡේදයේ දැක්වෙන්නේ 'උපමාවෙන් ඔපවත් වූ වග්ගය' නම් ශාස්ත්‍රීය ලිපිය යි. එහි ඕපම්ම වග්ගයේ සූත්‍ර 10ම ඇතුළත් වුව ද එම සූත්‍රයන්හි අන්තර්ගත සියලු ම උපමාවන් එහි දී දැක ගත නො හැකි ය.

පූජ්‍ය වල්මෝරුවේ පියරතන හිමියන් විසින් නැණස නම් ශාස්ත්‍රීය සඟරාවට රචනා කරන ලද ලිපිය වන්නේ 'මජ්ඣිම නිකායේ ඕපම්ම වග්ගයේ අන්තර්ගත සූත්‍ර පිළිබඳ කෙටි විවරණයක්' නම් ශාස්ත්‍රීය ලිපිය යි. එහි සූත්‍ර 10ම ඇතුළත් වුව ද එහි දී උන්වහන්සේ විසින් වැඩි අවධානයක් යොමු කර ඇත්තේ එහි ඇති උපමාවන්ට නො ව එහි ඇති ධර්ම කරුණුවලට ය.

මෙම පර්යේෂණ පත්‍රයෙන් සිදු කරනු ලබන්නේ ඕපම්ම වග්ගයේ ඇති සූත්‍රයන්හි අන්තර්ගත සියලු උපමාවන් විමර්ශනාත්මක ව අධ්‍යයනය කිරීම යි. එම නිසාවෙන් යථෝක්ත ශාස්ත්‍රීය ලිපි ද දත්ත ගැනීම සඳහා යොදාගැනෙයි.

**පර්යේෂණ ගැටලුව**

මජ්ඣිම නිකායේ ඕපම්ම වග්ගයෙහි නිරූපිත උපමා දේශනවල අර්ථය ග්‍රහණය කර ගැනීමට දායක වන්නේ කෙසේ ද?

**පර්යේෂණ අරමුණු**

බුදුන් වහන්සේ උපමා භාවිතය තුළින් තම ශ්‍රාවකයා හික්මවා ඇති ආකාරය, බුද්ධ දේශනාවේ ඇතුළත් වැදගත් ධර්ම කරුණු උපමා භාවිතය මගින් දේශනා කර ඇති ආකාරය හා එහි ඇති සුවිශේෂත්වය ප්‍රකට කරවීම.

**පර්යේෂණ ක්‍රමවේදය**

වඩාත් ගුණාත්මක භාවයෙන් යුක්ත පර්යේෂණයක් සිදු කිරීම සඳහා භාවිත කරනු ලබන ක්‍රමවේදය වන්නේ ග්‍රන්ථ සන්ධාර පර්යේෂණ ක්‍රමවේද ය යි. ප්‍රාථමික මූලාශ්‍ර හා ද්විතීක මූලාශ්‍ර මඟින් දත්ත රැස් කරමින්, එම දත්ත විශ්ලේෂණය කරමින් වඩාත් ඵලදායී මට්ටමින් පර්යේෂණය සිදු කරනු ලබයි.

**පර්යේෂණයේ වැදගත්කම**

බුදුන් වහන්සේ අවස්ථාවෝචිත ව තම ශ්‍රාවකයා හික්මවීම සඳහා මෙන් ම ධර්මය අවබෝධ කරලීම සඳහා උපමා භාවිත කරමින් ධර්මය දේශනා කර ඇති ආකාරය පෙන්වා දීම.

**සාකච්ඡාව**

බුදුදහම වනාහි ආකස්මිකව පහළ වූ දහමක් නො වේ. බුදුදහම පහළ වන සමය වන විට දෙසැටක් දාර්ශනික චින්තකයින් භාරතය පුරා සී සී කඩ විමධ්‍යගත ව සිටි බවට දීඝ නිකායේ බ්‍රහ්මජාල සූත්‍රය සාක්ෂි සපයනු ලබයි. දාර්ශනිකයන්ගේ අඩු පාඩු දැක, එම මිථ්‍යාවන් ප්‍රතික්ෂේප කරමින් නිවැරදි දහම ජනයාට අවබෝධ කර වීමට බුදුන් වහන්සේ පන්සාළිස් වසක් පුරාවට කටයුතු කළහ. දීර්ඝ කාලයක් පුරාවට ම මිථ්‍යා දාර්ශනිකයන්ගේ ග්‍රහණයට හසු වී සිටි භාරතීය ජනයාට නිවැරදි ධර්මය අවබෝධ කර වීම එතරම් පහසු

කටයුත්තක් නො වීය. ග්‍රාහකයාට නිවැරදි ධර්මය අවබෝධ කර වීමේ ඇති අවශ්‍යතාවය නිසා ම එම කර්තව්‍යය සඵල කර ගැනීමේ අදිටනින් බුදුන් වහන්සේ විවිධ ක්‍රම ශිල්ප භාවිත කරන්නට යෙදුණි. එසේ භාවිත කළ එක් ක්‍රමෝපායක් වනුයේ උපමා භාවිත ය යි. මජ්ඣිම නිකායේ මූල පණ්ණාසකයේ ඕපම්ම වග්ගය වනාහි එබඳු උපමාවන්ගෙන් සංගෘහිත වූ වග්ගයකි.

මෙම වග්ගයට 'ඕපම්ම' යන නාමය යෙදී ඇත්තේ මෙහි ඇතුළත් සූත්‍ර 10 උපමාවන්ගෙන් සංගෘහිත වී ඇති නිසා ය. 'ඕපම්ම' යන පාලි ව්‍යවහාරය ම පෙළ අටුවාවන්හි 'උපමා' යනුවෙන් ද දක්නට ලැබෙයි. එම දෙපදයෙන් ම සමාන කිරීම, ගැළපීම, උදාහරණය, නිදසුන යන අර්ථ සපයනු ලබන්නේ ය. උපමාව යනු සම්භාව්‍ය සාහිත්‍යයේ එන කාව්‍යාලංකාරයකි. කිසියම් කරුණක් වඩාත් මැනවින් හෙළි පෙහෙළි කර දැක්වීම පිණිස උපමාව අතිශයින් ම ඵලදායක වේ. උපමාව අපූරු ප්‍රයෝගයක් මෙන් ම රසෝත්පාදක වූ නිර්මාණාත්මක යෝජනයකි. (**මේධානන්ද හිමි, 2013: 194**). උපමා භාවිතය නූතනයේ ද දක්නට ලැබෙන සුලබ දර්ශනයකි. එය සාහිත්‍ය කෘතීන්හී පමණක් නො ව එදිනෙදා කථා ව්‍යවහාරයේ ද නිතර භාවිත කරන්නකි. බුදුන් වහන්සේ උපමා භාවිත කරමින් සිදු කළ සුවිශේෂී කර්තව්‍යය දෙස බලන විට නූතන උපමා භාවිතය තවමත් ළදරු අවධියේ පසුවන්නේ ය.

බුදුන් වහන්සේ ඇතැම් දාර්ශනික කරුණු වඩාත් නිරවුල්වත්, පැහැදිලිවත් ග්‍රාහකයාට අවබෝධ කරලීම සඳහා නන් අයුරින් ස්වකීය දේශනාවන් තුළ උපමා භාවිත කරන්නට යෙදුණු අතර, එහි අවසන් ප්‍රතිපෝෂණය (Feed Back) වූයේ ග්‍රාහකයා එය මැනවින් ග්‍රහණය කරගැනීම යි. ඇතැම් කරුණු ඇතැම් පුද්ගලයන්ට පහසුවෙන් අවබෝධ නො වන නිසාවෙන් එබඳු අවස්ථාවන්හී උපමා භාවිත කරමින් එම කරුණු සවිස්තරාත්මක ව ඉදිරිපත් කරන අතර, එමඟින් අර්ථය සුබාවබෝධ වෙයි.

උපමා බො මෙ අයං භික්ඛවෙ කතා අත්ථස්ස විඤ්ඤාපණාය. (**ම. නි. 1, 2005: 382**).

ඕපම්ම වග්ගයේ මුලින් ම මුණගැසෙන සූත්‍රය වන්නේ කකචූපම සූත්‍රය යි. මෙම සූත්‍රය දේශනා කරන ලද්දේ මෝලියඵග්ගුණ හිමියන් අරඹයා ය. මෝලියඵග්ගුණ හිමියන් ත්‍රිවිධ වේලා ඉක්මවා මෙහෙණින් හා මුසුව කටයුතු කිරීමත්, භික්ෂුණීන්ගේ දොස් කියන භික්ෂූන් හා කෝප වී නො සතුටු වී, නඩු පැවරීම සිදු කරනු ලබයි. ඒ නිමිති කොට එසේ කෝප වීම පැවිද්දෙකුට නුසුදුසු බවත්, පැවිද්දා සැබෑ අව්‍යාජ වූ මෙත් සිතින් ක්‍රියා කළ යුතු බවත් පෙන්වා දෙනු පිණිස කකචූපම සූත්‍රය දේශනා කරන ලදි.

කකචූපම සූත්‍රයේ මුලින් ම අන්තර්ගත උපමාව බුදුන් වහන්සේ භාවිත කර ඇත්තේ පඨම සම්බෝධි භික්ෂූන්ගේ ගුණ වයනු පිණිස ය. සතර මං සන්ධියක ගමනක් සඳහා සූදානම් කර වූ රියක් දක්ෂ රථාචාර්යවරයකු විසින් තමාට කැමති පරිද්දෙන් මෙහෙයවන්නාක් මෙන්, එකල භික්ෂූන් බුදුන් වහන්සේගේ අනුශාසනාව නොමැති ව සිහි ඉපදවීම් පමණකින් ම සංවර වූ බව සඳහන් වේ. එකළ භික්ෂූන් තුළ පැවති ගුණය උපමාවකින් පෙන්වා දෙන බුදුන් වහන්සේ භික්ෂූන්ට අවධාරණය කර සිටින්නේ අකුසලයන් දුරු කර කුසල් දහම්වල නැවත නැවත යෙදෙන ලෙස ය.

''සෙය්‍යථාපි භික්ඛවෙ සුභූමියං චාතුම්මහාපථෙ ආජඤ්ඤරථො යුත්තො අස්ස යීතො ඔධස්තපතොදො, තමෙනං දක්ඛො යොග්ගාචරියො අස්සදම්මසාරථී අභිරූහිත්වා වාමෙන හත්ථෙන රස්මියො ගහෙත්වා දක්ඛිණෙන හත්ථෙන පතොදං ගහෙත්වා යෙනිච්ඡකං යදිච්ඡකං සාරෙය්‍යාපි පච්චාසාරෙය්‍යාපි, එවමෙව ඛො භික්ඛවෙ න මෙ තෙසු භික්ඛූසු අනුසාසනී කරණීයා අහොසි. සතුප්පාදකරණීයමෙව මෙ භික්ඛවෙ තෙසු භික්ඛූසු අහොසි.'' **(ම. නි. 1, 2005: 312).**

පඨම සම්බෝධි සමයේ ශාසනය නිරවුල්ව පැවතියේ එකළ භික්ෂූන් සංසාරයෙහි ඇති භයංකාරත්වය හා ආදීනව දැක ප්‍රව්‍රජ්ජා භූමියට පත්ව සිටි පිරිසක් නිසාවෙනි. එම හේතූන් නිසාවෙන් ම පහසුවෙන් එම සංඝ සංස්ථාව පාළනය කිරීමට බුදුන් වහන්සේට හැකි විය. ඒ සඳහා අවශ්‍ය වූයේ සිහි කැඳවීම පමණ යි. ඕවාද ප්‍රාතිමෝක්ෂය දේශනා කළ පඨම සම්බෝධි සමයෙහි සිටි භික්ෂූන්ට බුදුන් වහන්සේ

අනුශාසනා කර සිටියේ සියලු පාපයන්ගෙන් වැලකෙන ලෙසත් (සබ්බ පාපස්ස අකරණං), කුසලය වර්ධනය කරගන්නා ලෙසත් (කුසලස්ස උපසම්පදා), තම සිත මනාව දමනය කරගන්නා ලෙසත් (සචිත්ත පරියො දපනං) ය. (**ධම්මපද, බුද්ධ වග්ගඃ 5 ගාථාව**).

මෙම කාලය පැවතියේ දශක දෙකක් වැනි කෙටි කාලයකි. එයට හේතුව වන්නේ සංඝ සංස්ථාව මෙම කාලය තුළ දී විපුලත්වයට පත් වූ නිසාවෙන් නොයෙක් මතධාරී විවිධ බාණ්ඩයන්ට අයත් පිරිස් සංඝ සංස්ථාව නියෝජනය කළ නිසාවෙනි. ශාසනය තුළ ආසවට්ඨානීය ධර්ම පහළ වීමත් සමඟ බුදුන් වහන්සේට විනය ශික්ෂා පැනවීමට සිදු විය. ආසවට්ඨානීය ධර්මයන්ට අමතර ව තවත් හේතූන් රාශියක් මහාවග්ගපාළියේ සඳහන් වේ. එනම්,

1. අන්‍යතීර්ථකයන් ලාභසත්කාරයෙන් පැවිදි වීම
2. ජීවක වෛද්‍යවරයාගෙන් ලෙඩ සුව කර ගැනීම සඳහා පැවිදි වීම
3. සේනාවෙහි බටයන් එයින් පලා ගොස් පැවිදි වීම
4. දඬුවමින් මිදීම සඳහා සොරුන් පැවිදි වීම
5. දඬුවම් විඳි පුද්ගලයින් එයින් ඇති වූ ලජ්ජාව නිසා පැවිදි වීම
6. දාසකමින් මිදීම සඳහා දාසයින් පැවිදි වීම
7. ඉගෙන ගැනීමට කම්මැලි අය පැවිදි වීම
8. වැඩට අකමැති අය පැවිදි වීම
9. බරපතළ පව් කළ අය විපාකවලින් මිදීමට පැවිදි වීම

යන කාරණාවන් ය. මෝලියඵග්ගුණ හිමියන්ට එම නාමය ලැබුණේ ගිහි කල මහත් වූ කොණ්ඩයක් තිබුණු නිසාවෙනි (සා තස්ස ගිහිකාලෙ මහන්තී අහොසි; තෙනස්ස මොලියඵගගුනොති සංඛා උදපාදි). (**මජ්ඣිමනිකායට්ඨකථා ෂෂ, 1986ඃ 78**).

කකචූපම සූත්‍රයේ අන්තර්ගත දෙවෙනි උපමාව වෙන් වී ඇත්තේ කුසලයෙහි ඇති අනුහස භික්ෂූන්ට අවධාරණය කිරීම වෙනුවෙනි. සල්වනයක සේවය කරන තරුණයෙක් සල් ගස් වෙළාගෙන ඇති පිළිල ඉවත් කර, තුරුණු වියේ පසුවන සල් ගස් පෝෂණය කරන විට පසුකලෙක ඒවා විපුලත්වයට, දියුණුවට පත්වන්නේ යම් අයුරකින් ද, එසේ ම භික්ෂූන් වහන්සේ ද අකුසලය දුරු කොට (අකුසලං පජහථ), කුසල ධර්මයන් වඩන විට (කුසලෙසු ධම්මෙසු ආයොගං කරොථ), එම භික්ෂූන් ද ශාසනයෙහි දියුණුවට, වැඩීමට මෙන් ම විපුලත්වයට ද පත්වන්නේ ය (ඉමස්මිං ධම්ම විනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සථ). (ම. නි. 1, 2005: 314).

බුදුදහමේ අග්‍රඵලය වන්නේ නිවන අවබෝධ කර ගැනීම යි. එම අග්‍රඵලය නෙලා ගැනීමට නම් භික්ෂුව විසින් ස්වකීය සිත කුසලයෙන් පෝෂණය කර ගත යුතු ය. ලොබ, දොස, මොහ යන අකුසල මූලයන් දුරු කොට අලොබ, අදොස, අමොහ යන කුසල මූල ධර්මයන් පෝෂණය කරමින් නිර්වාණගාමී මාර්ගයේ ගමන් කළ යුතු ය. අගාරික ජීවිතයෙන් නික්මී අනගාරික ජීවිතයට පිළිපන් භික්ෂුව ශාසන දායාදය ලබන්නේ සංසාර චාරිකාව අවසන් කිරීමේ අදිටන ඇතිව ය. බුදුන් වහන්සේ කුසලයෙහි ඇති අනුහස පළමු උපමාවෙන් නො නැවතී දෙවෙනි උපමාවෙන් ද අවධාරණය කර සිටින්නේ මෝලියඵග්ගුන වැනි භික්ෂූන් ශාසනය තුළ දළුලෑම නතර කිරීමේ අදහසින් විය හැකි ය. එවැනි භික්ෂූන් සංඝ සංස්ථාවේ පහළ වීම බුද්ධ ශාසනයේ ප්‍රතිමූර්තියට කැළලක් වන නිසාවෙනි. බුද්ධ ශ්‍රාවකයින්ගේ වැරැද්දක් දුටු විට බුදුදහමට පහර ගැසීමට මාන බලමින් සිටි අන්‍යාගමිකයින් භාරතය පුරා විමධ්‍යගත ව සිටීම මෙයට හේතුවක් ලෙස ගිණිය හැකි ය.

කකචූපම සූත්‍රය දේශනා කරනු ලබන්නේ කෝපයෙහි ඇති ආදීනව කියා පෑමටත්, මෛත්සිතක ඇති මහිමය පෙන්වා දීමටත් ය. බුදුන් වහන්සේගේ මෙම අරමුණු සාධනය කර ගැනීම සඳහා මෛත්සිතක ඇති වටිනාකම අගයනු පිණිස උපමාවන් 5ක් භාවිත කරන ලදි. එමෙන් ම කෝපයෙහි ඇති ආදීනව පෙන්වාදීම පිණිස වේදහිකා ගෘහණියගේ කථා ප්‍රවෘත්තිය ද දේශනා කරන ලදි. යම් පුරුෂයෙක් පොළොවක් නො පොළොවක් කිරීමට (මහාපඨවිං අපඨවිං

කරිස්සාමීති), අහසෙහි අකුරු ලිවීමට (ආකාසෙ රූපානි ලිඛිස්සාමීති), අවුලුවාගත් තණ සුලකින් ගංගානම් ගඟ තැවීමට උත්සාහ කිරීම (ඉමාය ආදිත්තාය තිණුක්කාය ගඞ්ගං නදිං සන්තාපෙස්සාමි), බළල් සමෙන් නිර්මාණය කරන ලද පසුම්බියක සර සර, බර බර යන හඬ උත්පාදනය කිරීමට උත්සාහ කිරීමට (බිළාර භස්තං මද්දිතං සුමද්දිතං.... සරසරං කරිස්සාමි හරහරං කරිස්සාමීති) (එම, 318-322). වෑයම් කරයි ද ඔහුගේ එම උත්සාහය නිෂ්ඵල ක්‍රියාවක් බවට පත්වන්නේ එසේ කිරීම නො කළ හැකි ක්‍රියාවක් නිසාවෙනි.

යථෝක්ත උපමාවන් භාවිත කරමින් බුදුන් වහන්සේ භික්ෂූන්ට අවධාරණය කර සිටින්නේ භික්ෂූන් වහන්සේ ද මෛත්‍රී සහගත ස්ථාවර සමාධියෙන් වාසය කරන විට එම භික්ෂුවගේ සිත අන්‍යයන්ගේ වචනවලින් හා ක්‍රියාවෙන් නො පෙරළිය හැකි බව යි. කකචූපම සූත්‍රයේ ප්‍රධානතම උපමාව මුණ ගැසෙන්නේ සූත්‍රයේ අවසානයේ දී ය. සොරු රැසක් විසින් කියතක් ගෙන ශරීරයේ අඟපසඟ කපන අවස්ථාවේ දීත් සිත වෙනස් නො කොට මෛත්‍රී සහගත චිත්තයෙන් යුක්ත ව, හිතානුකම්පීව වාසය කළ යුතු බව බුදුන් වහන්සේ දැඩි ව අවධාරණය කර ඇත.

''...කකචෙන චොරා ඔචරකා අඞ්ගමඞ්ගානි ඔකන්තෙය්‍යුං... මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරිස්සාමාති. එවංහි වො භික්ඛවෙ සික්ඛිතබ්බං.'' (එම).

මෙම කකචූපම අවවාදය නිතර මෙනෙහි කරන ලෙසත් (ඉමඤ්ච තුම්හෙ භික්ඛවෙ කකචූපමං ඔවාදං අභික්ඛණං මනසිකරෙය්‍යාථ), එසේ කිරීමෙන් එය බොහෝ කලක් සැපය පිණිස පවතින බව ද (තං වො භවිස්සති දීඝරත්තං හිතාය සුඛායාති) සූත්‍රාවසානයේ දැක් වේ. (එම). වෛරයෙන් වෛරය නො සන්සිඳෙන බවත් (නහි වෙරෙන වෙරානි), අවෛරයෙන් වෛරය සන්සිඳෙන බවත් (අවෙරෙන ච සම්මන්ති) බුද්ධ දේශනාව යි. (**ධම්මපද, යමක වග්ගඃ 5 ගාථාව**). සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේ දස පාරමිතාවන් පූරණය කරන සමයේ ක්ෂාන්ති පාරමිතාව පූරණය කළ අයුරු ක්ෂාන්තිවාද ජාතකයෙන් ද, මෛත්‍රී පාරමිතාව පූරණය කළ අයුරු මහා කපි හා මඝ මාණවක ජාතක කථා තුළින් ද දැක ගත හැකි ය.

ද්වේෂයෙන් හා වෛරයෙන් යුක්ත ව ජීවත් වීම සසර ගමන තව තවත් දිගු කර ගැනීමකි. ශාසන බ්‍රහ්මචරියාවෙහි නියුක්ත පුද්ගලයා ලෝකයා කෙරෙහි මෛත්‍රිය පැතිරිය යුතු ය (මෙත්තඤ්ච සබ්බ ලොකස්මිං). (**සුත්තනිපාත, 2005: 46**). මෙලෙස මෙත්සිත පතුරුවන පුද්ගලයා සුවසේ නිදයි (සුඛං සුපති), සුවසේ පිබිදෙයි (සුඛං පටිබුජ්ඣති), පාපී සිහින නො දකියි (න පාපිනං සුපිනං පස්සති), මනුෂ්‍යයින්ට ප්‍රිය වෙයි (මනුස්සානං පියො හොති), අමනුෂ්‍යයින්ට ප්‍රිය වෙයි (අමනුස්සානං පියො හොති), දෙවියන් රකියි (දේවතා රක්ඛන්ති), ගින්නේ, වසවිසෙන්, අවිආයුධවලින් අනතුරු නොම වෙයි (නාස්ස අග්ගි වා විසං වා සත්ථං වා මති), සිත සමාධිගත වෙයි (තුවටං චිත්තං සමාධියති), පෙනුම පැහැපත් වේ (මුඛවණ්ණො විප්පසීදති), මරණින් මතු බඹලොව ඉපදෙයි (උත්තරිං අප්පටි විජ්ඣන්තො බ්‍රහ්මලොකූපගො හොති). (**අං. නි. 5, 2005: 2**).

මෛත්‍රිය වනාහි සිව්බඹ විහරණවලින් පළමු විහරණය වේ. මෙය බ්‍රහ්ම විහරණයක් වන්නේ එය හොඳ අවබෝධයක් ඇති ව ම උදාර අරමුණකින් ක්‍රියාවට නැංවෙන නිසාවෙනි. බුදුන් වහන්සේට නන් අයුරින් ද්‍රෝහිකම් කළ දෙව්දත්ට පවා බුදුන් වහන්සේ මෛත්‍රී කළහ. බුදුන් වහන්සේගේ ධර්මය ඒ අයුරින් ම අනුගමනය කළ බිම්බිසාර රජතුමා ද තමාට දස වද දුන් අජාසත් රජු කෙරෙහි මෛත්‍රී සිතම පැතිරවීමෙන් ප්‍රකට වන්නේ මෛත්‍රියෙහි ඇති උදාරත්ව ය යි.

ඔපම්ම වග්ගයෙහි දෙවෙනි සූත්‍රය වන්නේ අලගද්දූපම සූත්‍රය යි. මෙම සූත්‍රයේ ප්‍රධාන උපමාව සර්ප උපමාව වන බැවින් මෙයට 'අලගද්දූපම' යන නාමය ලැබී ඇත. සාවද්‍ය දෘෂ්ටියක් ග්‍රහණය කොට බුද්ධ දේශනාව විකෘති අයුරින් පිළිගත් ගන්ධාබිපුත්ත අරිට්ඨ භික්ෂුව අරභයා දේශිත මෙම සූත්‍රයේ පළමු උපමාව වෙන් වී ඇත්තේ කාමයෙහි ආදීනව විදහාපෑමට ය. මෙහි දී කාමය ඇට සැකිල්ලකටත් (අට්ඨිකඞ්කලූපමා කාමා), මාංශ පේශියකටත් (මංසපෙසූපමා කාමා), තණ සුලකටත් (තිණුක්කූපමා කාමා), ගිණි අඟුරු වළකටත් (අඞ්ගාරකාසූපමා කාමා), සිහිනයකටත් (සුපිනකූපමා කාමා), පිරිළුවකටත් (යාචිතකූපමා කාමා), රුක් ඵලයකටත් (රුක්ඛඵලූපමා කාමා), අසිපතටත් (අසිසූනූපමා කාමා), මස් වැදැල්ලකටත් (සත්තිසූලූපමා කාමා), සර්ප හිසකටත් (සප්පසිරූපමා කාමා) උපමා කර ඇත. (**ම. නි. 1, 2005: 330**).

මෙහි දී බුදුන් වහන්සේ කාමයෙහි ඇති ආදීනව කෙතරම් භයංකාර දැයි යන්න පිළිබඳ ව භික්ෂූන්ට අවධාරණය කරලීම සඳහා එක ම අවස්ථාවේ දී කාමය උපමාවන් 10කින් පෙන්වා දී ඇත. කාම තණ්හාව වනාහි දුකට හේතුව ලෙස බුදුන් වහන්සේ මංගල ධර්ම දේශනාවේ දී ම පෙන්වා දී ඇත. (**සං. නි. 5 (2), 2005: 270**). කාමයට ඇලීම යනු පුද්ගලයා සසරට ඇලීම යි. පුද්ගලයාගේ නිවන් මඟ අහුරාලන පංචනීවරණ ධර්මයන්ගෙන් පළමු ධර්මතාවය වන්නේ ද කාමච්ඡන්ද ය යි. කාමය පිළිබඳ ව නන් අයුරින් විස්ථාරිතව දේශිත සූත්‍රයන් සඟි සාහිත්‍යයේ දැක ගත හැකි ය.

අලගද්දූපම සූත්‍රයේ සඳහන් මීළඟ උපමාව වන්නේ සර්ප උපමාවයි. මෙය සූත්‍රයේ ප්‍රධානතම උපමාව ද වන්නේ ය. ධර්මය වැරදි අයුරින් ග්‍රහණය කර ගත් විට පුද්ගලයාට වන හානිය සර්පයෙකු වැරදි අයුරින් ග්‍රහණය කර ගත් පුද්ගලයා සර්ප දෂ්ඨනයට ලක් වන උපමාවෙන් ද, ධර්මය නිවැරදි ව ග්‍රහණය කර ගත් පුද්ගලයාට සිදු වන සැපය සර්පයෙකු නිවැරදිව අල්ලා ගන්නා පුද්ගලයෙකුගේ උපමාවෙන් ද පෙන්වා දී ඇත. මෙහි දී ධර්ම යනුවෙන් හඳුන්වා ඇත්තේ නවාංග සත්ථු ශාසනයයි (සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං). සර්පයකුගේ මැදින් හෝ අගින් අල්ලා ගතහොත් සර්පයා විසින් ආපිට හැරී දෂ්ඨ කරනු ලබන්නේ ය. සර්පයාගේ බෙල්ලෙන් අල්ලා ගතහොත් පමණක් සර්පයාට දෂ්ඨ කළ නො හැකි වන්නේ ය. එමෙන් ම ධර්මය ද වැරදි තැනින් ග්‍රහණය කර ගතහොත් එය පුද්ගලයාගේ අහිත පිණිස පවතින අතර, නිවැරදිව ග්‍රහණය කර ගන්නා විට එම ධර්මයන් දිගු කාලයක් හිත සුව පිණිස පවතින්නේ ය. (තෙසං තෙ ධම්මා සුග්ගහිතා දීඝරත්තං හිතාය සුඛාය සංවත්තන්ති). (**ම. නි. 1, 2005: 336**).

ධර්මය නිවැරදිව ග්‍රහණය කර ගත යුත්තේ සසරින් එතෙර වීම පිණිස ය. සසරින් එතෙර වූ පසු ධර්මය වුව ද අත්හැරිය යුතු ය. ධර්මය පහුරකට උපමා කරමින් බුදුන් වහන්සේ දේශනා කරන්නේ ධර්මය පිළිපැදිය යුතු වන්නේ සසරින් එතෙර වීම පිණිස විනා ග්‍රහණය කරගැනීම පිණිස නො වේ. බිය සැක ඇති මෙතෙර නම් අප ජීවත් වන තුන් ලෝකයයි. බිය සැක නැති එතෙර නම් නිර්වාණයයි. එතෙර විය යුතු සාගරය නම් සංසාරයයි. ඒ සඳහා උපකාර වන පහුර වන්නේ ධර්මයයි.

''එවමෙව ඛො භික්ඛවෙ කුල්ලූපමො මයා ධම්මො දෙසිතො නිත්ථරණත්ථාය නො ගහණත්ථාය. කුල්ලූපං වො භික්ඛවෙ ධම්මං දෙසිතං අජානන්තෙහි ධම්මාපි වො පහාතබ්බා, පගෙව අධම්මා.'' (එම, 338).

කාමයෙහි ඇති ආදීනවයනුත්, ධර්මය වැරදි ලෙස ග්‍රහණය කිරීමෙන් ඇතිවන විපාකයනුත්, ධර්මය නිවැරදිව ග්‍රහණය කිරීමෙන් ඇතිවන ප්‍රයෝජනයනුත්, සංසාර සාගරයෙන් එතෙර වීම පිණිස පමණක් ධර්මය භාවිත කළ යුතු යැයි පෙන්වා දීමට බුදුන් වහන්සේ විසින් අවස්ථානෝචිතව උපමාවන් භාවිත කරමින් තමන් වහන්සේට දේශනා කිරීමට අවශ්‍ය දහම් කරුණු දේශනා කිරීම පිණිස උපමා යොදා ගත් අයුරු මෙම සූත්‍රයෙන් ගම්‍යමාන වේ.

තුඹසක් උපමා කරගෙන දේශිත බැවින් 'වම්මික' නමින් හැඳින්වෙන ඔපම්ම වග්ගයේ තුන් වෙනි සූත්‍රය කුමාරකස්සප තෙරුන් වහන්සේගෙන් දෙවියෙක් අසන ලද ප්‍රශ්න කුමාරකස්සප තෙරුන් වහන්සේ බුදුන් වහන්සේගෙන් විමසූ විට බුදුන් වහන්සේ විසින් දෙවියාගේ උපමාවාචී ගැටලු විසඳූ ආකාරය මෙම සූත්‍රයෙන් දැක ගත හැකි ය. රාත්‍රියෙහි දුම් දමන, දවාලෙහි ඇවිලෙන තුඹසකි. එම තුඹස සාරන ලෙස බමුණෙක් නුවණැත්තෙකුට කියයි. අවිය ගෙන සාරන නුවණැත්තාට පිළිවෙළින් දොර අගුලක්, මැඩියෙක්, දෙමංසලක්, පෙරහනක්, ඉබ්බෙක්, මස් කපන කැත්තක්, මස් ලොඹුවක්, මස් වැදැල්ලක් හා අවසානයේ නාගයෙක් හමුවෙයි. බමුණාගේ කියමන අනුව ඉහත කී එකින් එක ඉක්මවා තුඹස සාරන නුවණැත්තාට අවසන හමුවන නාගයාට නමස්කාර කරන ලෙස බමුණාගෙන් උපදෙස් ලැබෙන්නේ ය. මෙම උපමාව ව්‍යංගාර්ථවත් වේ. ප්‍රහෙළිකාවක් බඳු වූ එහි අර්ථය බුදුරදුන්ගෙන් විමසන කුමාරකස්සප හිමියන්ට මෙහි අර්ථ විවරණ එකින් එක සපයනු ලබන්නේ ය.

තුඹස යනු සතර මහා භූත රූපයන්ගෙන් හටගත් ශරීරයයි. රාත්‍රියෙහි දුම් දැමීම යනු දවාලෙහි කළ යුතු කාර්යයන් රාත්‍රියෙහි කල්පනා කිරීමයි. දවාලෙහි ඇවිලීම යනු රැයෙහි සිතූ දේ දහවල කිරීමයි. නුවණැත්තා යනු සේඛ පුද්ගලයා හෙවත් භික්ෂුවයි. ශස්ත්‍රය නම් ආර්ය ප්‍රඥාවයි. බමුණා නම් බුදුන් වහන්සේ ය. සෑරීම වීර්යාරම්භයයි.

හිඳි අගුල නම් අවිද්‍යාවයි. මැඩියා නම් බලවත් ක්‍රෝධයයි. දෙමංසල වනුයේ විචිකිච්ඡාවයි. කර පෙරහන නම් පඤ්චනීවරණ ධර්මයයි. මස් ලොඹුව හා මස් කැත්ත යනු පස්කම් සුවයයි. මස් වැදැල්ල යනු නන්දිරාගයයි. කෙළවර මුණගැසෙන නාගයා වනුයේ ක්ෂීණාශ්‍රවයන් වහන්සේ ය. (එම, 358-360).

නිවන් ලබා ගැනීමේ අදිටනින් ප්‍රවෘජ්ජාවට පත් භික්ෂුව නිර්වාණගාමී මාර්ගයේ ගමන් කළ යුතු පිළිවෙළ යථෝක්ත උපමාවෙන් ප්‍රකාශිත වේ. වීර්යයෙන් යුක්තව, පසුබැසීමෙන් තොරව, සාංසාරික දුක්ඛ දෝමනස්සයන්ට හේතු වූ අසාර ධර්මතාවයන් ඉක්මවා ගොස් අර්හත්වය වෙත ළඟා වන අන්දම තුඹස පාදක කර ගනිමින් දේශනා කර ඇති ආකාරය පිළිඹිබු වේ.

බෞද්ධ ආර්ය මාර්ගයේ පිළිවෙළ පිළිබඳ ව කරුණු අනාවරණය කෙරෙන සූත්‍රයක් ලෙස රථවිනීත සූත්‍රය හැඳින්විය හැකි ය. බුදුදහමේ ගැඹුරු ඉගැන්වීමක් වන සප්ත විශුද්ධිය පැහැදිලි කෙරෙන මෙම සූත්‍රය මන්තානිපුත්ත පුණ්ණ තෙරුන් වහන්සේ හා සැරියුත් හිමියන් අතර ඇතිවන සංවාදයක ප්‍රතිඵලයකි. මෙහි දී විනීත රථ 7ක් උපමා කරමින් මන්තානිපුත්ත පුණ්ණ තෙරුන් වහන්සේ සප්ත විශුද්ධිය විස්ථාරණය කරන නිසාවෙන් මෙම සූත්‍රය 'රථවිනීත' යන නාමයෙන් හඳුන්වනු ලැබේ. මෙය ඔපම්ම වග්ගයේ ප්‍රථම ශ්‍රාවක භාෂිත දේශිත සූත්‍රය වේ.

සැරියුත් හිමියන් පුණ්ණ හිමියන්ගෙන් විමසා සිටින්නේ සීල විශුද්ධි, චිත්ත විශුද්ධි, දිට්ඨි විශුද්ධි, කංඛාවිතරණ විශුද්ධි, මග්ගාමග්ගඤාණදස්සන විශුද්ධි, පටිපදාඤාණදස්සන විශුද්ධි, ඤාණදස්සන විශුද්ධි යන විශුද්ධීන්ගෙන් අනුපාදාපරිනිර්වාණය වන්නේ ද යනුවෙනි. එම පැනයට පුණ්ණ හිමියන් පිළිතුරු සපයන්නේ කොසොල් රජතුමාගේ ගමන් මාර්ගය විනීත රථ 7ක් ඇසුරින් සිදුවන ආකාරය උපමාවට ගනිමිනි. එහි දී පුණ්ණ හිමියන් පවසා සිටින්නේ සැවැත්නුවර සිට සාකේත නුවරට විනීත රථ 7කින් ගමන් ගැනීමට සූදානම් වන රජතුමා පළමු රථයෙන් ටික දුරක් ගොස් එය අතහැර දමා දෙවෙනි රථයට ගොඩවන්නේ ය (පඨමං රථවිනීතං අභිරූහෙය්‍ය පඨමෙන රථවිනීතෙන දුතියං රථවිනීතං පාපුණෙය්‍ය).

මෙලෙස රථයෙන් රථය අතහැර සත්වෙනි රථයෙන් සාකේත නුවරට පැමිණෙන රජතුමා නුවරට පැමිණි පසු සත්වෙනි රථය ද අතහැර දමන්නේ ය. ඒ ආකාරයෙන් ම සීල විශුද්ධිය චිත්ත විශුද්ධියට ද (සීලවිසුද්ධි යාවදෙව චිත්තවිසුද්ධත්‍ථා), චිත්ත විශුද්ධිය දිට්ඨි විශුද්ධියට ද (චිත්තවිසුද්ධි යාවදෙව දිට්ඨිවිසුද්ධත්‍ථා), දිට්ඨි විශුද්ධිය කංඛාවිතරණ විශුද්ධියට ද (දිට්ඨිවිසුද්ධි යාවදෙව කඞ්කාවිතරණවිසුද්ධත්‍ථා), කංඛාවිතරණ විශුද්ධිට මග්ගාමග්ගඤාණදස්සන විශුද්ධියට ද (කඞ්ඛාවිතරණවිසුද්ධි යාවදෙව මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධත්‍ථා), මග්ගාමග්ගඤාණදස්සන විශුද්ධිය පටිපදාඤාණදස්සන විශුද්ධියට ද (මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධි යාවදෙව පටිපදාඤාණදස්සන විසුද්ධත්‍ථා), පටිපදාඤාණදස්සන විශුද්ධිය ඤාණදස්සන විශුද්ධියට ද (පටිපදාඤාණදස්සන විසුද්ධි යාවදෙව ඤාණදස්සන විසුද්ධත්‍ථා), ඤාණදස්සන විශුද්ධිය අනුපාදාපරිනිර්වාණය පිණිස ද (ඤාණදස්සනවිසුද්ධි යාවදෙව අනුපාදාපරිනිබ්බානත්‍ථා) පවතින බව පැවසීය. (**එම, 368-370**).

නිවන් දැකීමට මහෝපකාරී වන පිරිසිදුවීම් 7ක් ලෙස සප්ත විශුද්ධිය හැඳින්විය හැකි ය. මෙම විශුද්ධි 7 එකකට එකක් උපකාරව පවතින්නේ ය. මෙහිදී පුණ්ණ හිමියන් අවස්ථානෝචිත උපමාවක් යොදා ගනිමින් සැරියුත් හිමියන්ට මෙම සප්ත විශුද්ධීන්ගේ පවත්නා හේතු ඵල සම්බන්ධතාවය මැනවින් පහදා දෙන්නේ ය. පුණ්ණ හිමියන් මෙම සප්ත විශුද්ධීන් උපමාවෙන් පෙන්වීමට පෙර සැරියුත් හිමියන්ට පවසා සිටින්නේ උපමාව වනාහි නුවණැත්තන්ට අර්ථ ග්‍රහණය කර ගැනීමට පහසුවක් සලසන බව (උපමායපිධෙකච්චෙ විඤ්ඤූ පුරිසා භාසිතස්ස අත්‍ථං අජානන්ති) පවසන්සේ උපමාවේ ඇති උපයෝගිතාවය හා සුවිශේෂත්වය ගම්‍යමාන කරමිනි. (**එම, 368**).

තෘණ භූමි වගා කොට ඒවා කෑමට එන මුවන් අල්වා ඝාතනය කිරීමෙන් සිය ජීවිකාව පවත්වාගෙන යන වැද්දන් උපමා වශයෙන් ගෙන භික්ෂූත්වයේ ඇති වටිනාකම අවබෝධ කරලීමට දේශිත සූත්‍රය වන්නේ නිවාප සූත්‍රයයි. පළමුව බුදුන් වහන්සේ මුවන් හා වැද්දන් සම්බන්ධ කර ගනිමින් කරුණු විස්තාරණය කරන අතර, එහි දී මුවන් සිව් වැදෑරුම් කොට දක්වමින් ඔවුන් ඝාතකයන්ගේ හෙවත් වැද්දන්ගේ ග්‍රහණයට හසුවන ආකාරය පෙන්වා දී ඇත.

පළමු මුව සමූහයෝ වැද්දාගේ වසඟයට පත්වන්නේ ඒ තණ කෙතට පැමිණ මුසපත් වී තණ අනුභව කොට මදයට හා ප්‍රමාදයට පත්වීමේ ප්‍රතිඵලයක් වසයෙනි. දෙවැනි මුව සමූහය පළමු මුව සමූහයට සිදු වූ විනාශය දැන තණ අනුභවයෙන් සම්පූර්ණයෙන් ම වැළකී සිටියහ. නමුත් ගිම්හානය උදාවීමත් සමඟ ම තණ හා ජලය සිඳී යාම නිසාවෙන් එම මුව රැළ කෘෂ වී ඔවුන්ගේ ශක්තිය ද පිරිහී ගියේ ය. එම නිසාවෙන් එම මුව රැළ ද තෘණ භූමියට පැමිණ, තෘණ අනුභව කොට මදයට හා ප්‍රමාදයට පත්වීම නිසාවෙන් ඔවුන් ද වැද්දන්ගේ ග්‍රහණයට හසුවන්නේ ය. තෙවන මුව රංචුව ද දෙවැනි මුව රැළට සිදු වූ විනාශය දැන වැද්දන්ගේ තණ කෙතින් පිටත සිටිමින් තණ අනුභව කොට නික්මී ගියේ ය. මෙම මුවන්ගේ වංචනික ස්වභාවය දත් වැද්දන් තණ කෙත විශාල කර එම මුව රංචුව ද හසු කර ගත්හ. සිව්වෙනි මුව රංචුව තෙවෙනි මුව රැළට සිදු වූ විනාශය දැන තණ කෙතට නො පැමිණෙමින් වැද්දන්ගේ ගමන් මාර්ගයේ ද නො සිටිමින් තණ අනුභව කරන්නේ නමුදු මදයට හා ප්‍රමාදයට පත් නොවී සිටියහ. එබැවින් එම මුව රංචුව වැද්දන්ගේ ග්‍රහණයට හසු නො වූහ.

මෙම සූත්‍රයේ නිවාප හෙවත් තෘණ කෙත යනුවෙන් හඳුන්වා ඇත්තේ පඤ්චකාම ගුණයන් ය (නිවාපොති ඛො භික්ඛවෙ පඤ්ඤන්නෙතං කාමගුණානං අධිවචනං). නෙවාපික හෙවත් වැද්දා යනු පවිටු මාරයා ය (නෙවාපිකොති ඛො භික්ඛවෙ මාරස්සෙතා පාපිවතො අධිවචනං). නෙවාපිකපරිසා යනු මාර පිරිස ය (නෙවාපිකපරිසාති ඛො භික්ඛවෙ මාරපරිසායෙතා අධිවචනං). මුව සමූහය යනු ශ්‍රමණ බ්‍රාහ්මණිකයන් ය (මිගජාතාති ඛො භික්ඛපෙ සමණබ්‍රාහ්මණානෙතා අධිවචනං). (එම, 382).

මුල් ම මුව සමූහයා මෙන් ඇතැම් මහණ බමුණන් ද පස්කම් සැපයට ලොල් වී එහි ඇති රසයෙන් මුසපත්ව මාරයාගේ වසඟයට හසුවන්නාහ. දෙවන මුව සමූහයා මෙන් ඇතැම් මහණ බමුණන් පස්කම් සැපයට ලොල්ව විනාශයට පත් භික්ෂු සමූහයා දැක තමන් එසේ පත් නො වන්නට අදිටන් කොටගෙන අරණ්‍යගතව වාසය කරන්නේ නමුදු ඔවුනට එය දිගු කාලයක් එසේ කිරීමට නො හැකි වන්නේ කල්යත් ම විවිධ දුෂ්කරතාවයන්වලට මුහුණ පෑමට සිදුවන නිසාවෙනි. එම නිසාවෙන් ඔවුහු තම අදිටන පසෙකලා පස්කම්

සැපයට ගිජුවීම නිසාවෙන් ඔවුන් ද මාරයාගේ වසඟයට පත්වන්නේ ය. තෙවැනි මුව පිරිස යම් සේ ද එසේ ම ඇතැම් මහණ බමුණන් පෙර භික්ෂූන්ට සිදු වූ හානිය දැක පස්කම්හි ඇල්ම දුරු කොට එයින් පරිබාහිරව හිඳිමින් ඒවා ඇසුරු කරන්නේ නමුදු ඔවුහු ද ශාස්වත උච්ඡේද දෘෂ්ටීන්හී බැසගත් නිසාවෙන් මාරයාගේ වසඟයට හසු වී විනාශ මුඛයට ගමන් කරන්නේ ය. සිව්වෙනි මුව සමූහයා යම් සේ ද ඒ අයුරින් ඇතැම් භික්ෂු කෙනෙක් මුල් පිරිසට සිදු වූ හානිය දැක අවබෝධයෙන් ආඪ්‍යව පස්කම් සැපයට ගිජු නොවී වාසය කරන නිසාවෙන් මාරයාගේ වසඟයට හසු නොවන අතර, සංසාර චාරිකාව ද නිමා කරන්නේ ය.

බුදුන් වහන්සේ පහළ වන යුගය වන විට දෙසැටක් දාර්ශනික චින්තකයින් භාරතය පුරා විමධ්‍යගතව පැවති බව දීඝ නිකායේ බ්‍රහ්මජාල සූත්‍රයේ සඳහන් වේ. එම දාර්ශනිකයන් සියලු දෙනා ම පාහේ ශාස්වත හා උච්ඡේද දෘෂ්ටීන්ට බැසගත් අය වූහ. මංගල ධර්ම දේශනාවේ දී ම බුදුන් වහන්සේ පස්වග තවුසන්ට දේශනා කරන්නේ හීන වූ, ග්‍රාම්‍ය වූ, ලාමක වූ, අනර්ථය පිණිස පවතින්නා වූ (හීනො ගම්මො පොථුජ්ජනිකො අනරියො අනත්ථසංහිතො) ශාස්වත හා උච්ඡේද දෘෂ්ටීන් අත්හැර දමන ලෙසය (**සං. නි. 5 (2)ඃ 270**). තවදුරටත් බුදුසමය අවධාරණය කරන්නේ මෙම දෘෂ්ටීන්ගෙන් මිදී මධ්‍යම ප්‍රතිපදාවේ ගමන් ගන්නා ලෙස ය. නිවාප සූත්‍රයේ සඳහන් අන්දමට පළමු, දෙවැනි, තෙවැනි මුව සමූහයා විනාශයට පත්වන්නේ පස්කම් සැපයට ලොල් විම නිසාවෙනි. එනම් ශාස්වත හා උච්ඡේද දෘෂ්ටීන්ට බැසගත් නිසාවෙනි. සිව්වෙනි මුව සමූහයා වැද්දන්ට හසු නොවී සුව සේ වාසය කරන්නේ පස්කම් සැපයට ගිජු නොවූ නිසා ය. එනම් මධ්‍යම ප්‍රතිපදාවේ ගමන් කළ නිසාවෙනි.

අරියපරියෙසන නාමයෙනුත් හැඳින්වෙන පාසරාසි සූත්‍රයෙහි ආර්ය හා අනාර්ය යනුවෙන් පර්යේෂණ විධි 2ක් පිළිබඳ තොරතුරු ඇතුළත් වනවා සේ ම සිදුහත් බෝසත් චරිතය පිළිබඳ තොරතුරු ද මෙහි ඇතුළත් වේ. සිදුහත් බෝසතාණන්ගේ අභිනිෂ්ක්‍රමණය කිරීම, ආලාර කාලාම හා උද්දකරාම පුත්‍ර යන ගුරුවරුන් හමුවීම, වීර්යය

වැඩීම, බුදු වූ පසු සහම්පති බ්‍රහ්මයා විසින් ධර්ම දේශනා කිරීමට ආරාධනා කිරීම, උපක ආජීවකයාගේ මුණගැසීම හා පස්වග තවුසන්ට ධර්මය දේශනා කිරීම යනාදී වැදගත් තොරතුරු සමුදායක් මෙම සූත්‍රයේ අන්තර්ගත වේ.

සහම්පති බ්‍රහ්මයාගේ පැමිණීම පෙන්වා දෙනු පිණිස මෙහි පළමු උපමාව වෙන් වී ඇත. යම් ශක්තිමත් පුරුෂයෙක් හැකිලූ අත දිගු කෙරේ ද (සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය), දිගු කළ අත හකුලුවන්නේ ද (පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය) ඒ ආකාරයෙන් සහම්පති බ්‍රහ්මයා බඹලොව සිට බුදුන් අභිමුඛයට පැමිණි බව සඳහන් වේ. (ම. නි. 1, 2005: 408). අතක් දිගු කිරීමට හා හැකිලීමට ගතවන්නේ ඉතාමත් කෙටි කාලයකි. සහම්පති බ්‍රහ්මයාගේ ආගමනය එයට උපමා කර තිබීමෙන් ගම්‍යමාන වන්නේ ඔහුගේ ඍද්ධි බලය යි.

බුද්ධත්වයෙන් පසු බුදුන් වහන්සේ ධර්ම දේශනා කිරීමට මැළි වූ බව සූත්‍රයෙහි ම සඳහන් වේ. සහම්පති බ්‍රහ්මයා පැමිණෙන්නේ බුදුන් වහන්සේගේ මන්දෝත්සාහිභාවය දුරු කොට ධර්ම දේශනා කිරීමට බුදුන් වහන්සේ උත්සාහ කරවීම පිණිස ය. සහම්පති බ්‍රහ්මයා බුදුන් වහන්සේට පවසා සිටින්නේ කඳු මුදුනක සිටින්නෙකු හට හාත්පස ජනයා දකින්නේ යම් සේ ද, ඒ ආකාරයෙන් ම ධර්ම ප්‍රාසාදයට නැග ජාති ජරාදියෙන් මැඩුණු සත්ව සමූහයා බලා ඔවුනට අනුකම්පා පිණිස ධර්මය දේශනා කරන ලෙස ආරාධනා කර සිටියේ ය.

සෙලෙ යථා පබ්බතමුද්ධනිට්ඨිතො - යථාපි පස්සෙ ජනතං සමන්තතො

තථූපමං ධම්මමයං සුමෙධ - පාසාදමාරුය්හ සමන්තචක්ඛු (එම, 410).

සූත්‍රයේ මීළඟට හමුවන්නේ නෙළුම් මල් සඳහන් වන උපමාවකි. යම් කිසි විලක නෙළුම් මල් හටගත්ත ද ඒවා දියෙන් උඩට මතු නො වන්නේ ය. ඇතැම් නෙළුම් මල් විලෙහි ජලය හා සමානව හටගන්නේ ය. ඇතැම් නෙළුම් මල් ජලයෙන් උඩට පැන නැගී ජලයෙහි නො ගැවී පවතින්නේ ය. ඒ ආකාරයෙන් ම ජනයා

ද අවම, මධ්‍යම හා උපරිම පෞරුෂ ඇත්තෝ වෙති. කෙලෙස් අඩු වැඩි වූ ද (අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ), තියුණු හා මෘදු ඉන්ද්‍රිය ඇත්තා වූ ද (තික්ඛින්‍ද්‍රියෙ මුදින්‍ද්‍රියෙ), යහපත් ආකාර ඇති නැති (ස්වාකාරෙ ද්වාකාරෙ), ධර්මාවබෝධයට සමත්කම් ඇති නැති (සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ), පරලොව හා කෙලෙස් බිය දක්නා නො දක්නා සත්වයන් දැක (පරලොකවජ්ජභයදස්සාවිනෙ) බුදුන් වහන්සේ දහම් දෙසීමට යොමු වූ බව සඳහන් වේ. (එම).

සූත්‍රයෙහි අවසානයට ම හමුවන්නේ වැදගත් ම උපමාව වන පාසරාසි උපමාවයි. මෙම පාසරාසි උපමාව බුදුන් වහන්සේ අවස්ථා තුනකදී භාවිත කර ඇති ආකාරය දැක ගත හැකි ය. වනයෙහි සිටින මුවෙක් මළ පුඩුරැස මත සයනය කරයි නම්, එහි ම ඇලෙයිනම් හෙතෙම ව්‍යසනයට පත්වන්නා සේ ම වැද්දාගේ ග්‍රහණයට ද හසුවන්නේ ය. ඒ අයුරින් ම පස්කම් ගුණයන්හි ඇලුනු භික්ෂුව ද මාරයාගේ වසඟයට හසුවන්නේ ය. යම් සේ වන මුවෙක් මල පුඩුරැස මත සයනය කරන්නේ නමුදු එහි නොම ඇලෙන්නේ ය. එම නිසාවෙන් ම ව්‍යසනයෙන් මෙන් ම වැද්දාගේ ග්‍රහණයෙන් ද මිදෙන්නේ ය. භික්ෂුව ද පස්කම් ගුණයන්හි නොම ඇලුණු විට මාරයාගේ වසඟයෙන් මිදෙන්නේ ය. යම් මුවෙක් වැද්දාට හමුනොවීම නිසා බිය රහිතව වනයේ වසන්නේ යම් සේ ද, එපරිද්දෙන් පස්කම් ගුණයන්ගෙන් හා අකුසල ධර්මයන්ගෙන් වෙන් වී (විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි), විතර්ක, විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ද ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරයි ද (සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති), එබඳු භික්ෂුව මාරයා අන්ධ කළ බවත් (අන්‍ධමකාසි මාරං), පාපී මාරයාගේ නො දැක්මට පැමිණෙන බවත් (අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො) බුදුන් වහන්සේ විසින් තව දුරටත් අවධාරණය කර සිටියි. (එම, 422).

බුදුන් වහන්සේ පස්වග තවුසන් කරා ධර්මය දේශනා කිරීම පිණිස එළඹෙන විට පස්වග තවුසන් බුදුන් වහන්සේ කෙරෙහි මවාගත් චිත්ත රූපය යහපත් එකක් නො වේ. එම නිසාවෙන් ඔවුන්ගේ මිථ්‍යා දෘෂ්ටිය දුරු කිරීමට මෙම පාසරාසි උපමාව භාවිත කළා විය හැකි ය. මෙම පාසාරාසි උපමාවට සමාන ම උපමාවක් නිවාප සූත්‍රයේ ද දැක

ගත හැකි ය. මෙම උපමාවන් දෙකෙන් ම කියවෙන්නේ ශාස්වත හා උච්ඡේද දෘෂ්ටීන්ගේ අසාරත්වයත්, බුදුදහමේ ඇති සුවිශේෂත්වයත් ය.

ඇතුන්ගේ පා සටහන් උපමා වශයෙන් ගෙන කරුණු දක්වා ඇති සූත්‍රය චූල්ලහත්ථිපදොපම සූත්‍රයයි. හත්ථිපදොපම නාමයෙන් සූත්‍රයන් 2ක් ඇති අතර, චූල්ලහත්ථිපදොපම සූත්‍රය එහි පළමු වැන්නයි. ජානුස්සෝනි නම් බ්‍රාහ්මණයකු අරඹයා බුදුන් වහන්සේ විසින් මෙම සූත්‍රය දේශනා කර ඇත. ඊට ප්‍රථම වච්චායන හිමියන් හා බමුණා අතර ඇති වූ සංවාදයක් ද සූත්‍රාරම්භයේ දැක ගත හැකි ය.

සූත්‍රයේ බුදුන් වහන්සේ වෙත පවත්නා උසස් ගුණාංග හතරක් ඇත් පියවරයන්ට උපමා කරමින් වච්චායන හිමියන් ජාණුස්සෝනි බමුණාට ධර්මය දේශනා කරන්නේ ය. ඇතැම් ක්ෂත්‍රිය කෙනෙක් තමන් දැනුම් ඇත්තෙකැයි යන අදහසින් බුදුන්ගෙන් ඇතැම් ප්‍රශ්න විචාරන්නේ ය. විචාරන ප්‍රශ්න විසඳුවහොත් බුදුන් හා වාද කරමි. මෙබඳු ආකල්ප ඇතිව බුදුන් හමුවට පැමිණෙති. එසේ පැමිණි ඔවුහු බුදුන් හා කරන කතා බහෙන් අනතුරුව තමා මනාව කරුණු වටහා ගන්නේ ය. නැවත වාද කරන්නට තරම් හේතුවන කරුණු ඔවුනට නොමැතිව ඔවුහු පෙරළා යති. මෙය බුදුන් වෙත ඇති ගුණයකි. එය ඇතුන්ගේ පළමු පියවර හඳුනාගැනීමක් වැනි ය.

ඇතැම් බ්‍රාහ්මණයෙක් බුදුන් හමුව පැන විචාරා පිළිතුරු දුනහොත් ඒ ඇසුරින් වාදාරෝපණය කරමියි යන අදහසින් බුදුන් වෙත එළඹෙයි. එහෙත් බුදුන් හමුව කතා බහ කිරීමෙන් පසුව විමසන්නට තරම් කිසිවක් ඔවුන් තුළ ඉතිරි නොවෙති. ඔවුහු සතුටු සිත් ඇතිව එතනින් නික්මෙති. මෙය බුදුන් වහන්සේ තුළ දක්නට ඇති දෙවැනි ගුණාංගය යි. එය දෙවැනි ඇත් පියවර හඳුනාගැනීමක් වැනි ය.

ඇතැම් ගෘහපති කෙනෙක් බුදුන් හමුව පැන විචාරමියි යන අදහස ඇතිව උන්වහන්සේ වෙත එළඹෙති. ඔවුහු ද පෙර පරිදිම සත්‍ය අවබෝධ කරගෙන පිටව යයි. මේ තෙවෙනි ගුණය වන අතර, එය තෙවෙනි ඇත් පියවර හඳුනාගැනීමක් වැනි ය.

ඇතැම් ශ්‍රමණ පණ්ඩිත කෙනෙක් පෙර අය සේ ම බුදුන් පරදවන්නට සිතති. බුදුන් හමුවට පැමිණෙන ඔවුහු පිරුණු දැනුම්

ඇතිව පිටව යති. මෙය සිව්වැනි ගුණය යි. එය සිව්වැනි ඇති පියවර හඳුනාගැනීමක් වැනි ය.

මෙසේ වච්චායන හිමියන් බුදුන් වෙත පවත්නා ඥාණ පද හතරක් විවරණය කර දක්වති. මෙම විවරණය ඇසූ ජාණුස්සෝනි බමුණාට බුදුන් වහන්සේට නමස්කාර කිරීමට සිත් පහළ වන්නේ ය. ඔහු බුදුන් වහන්සේ හමුවට ගොස් උන්වහන්සේට තමන් වච්චායන තෙරුන් වෙතින් අසූ ඇත් පද උපමාව ප්‍රකාශ කළේ ය. එවිට බුදුහු එපමණකින් හත්ථිපදෝපමාව සම්පූර්ණ නොවන බැවින් එය දේශනා කළේ ය.

ඇත් වනයක වසන්නෙක් එයට පිවිසෙනුයේ දික් පුළුල් මහත් ඇත් පියක් දකියි. ඔහු දක්ෂයෙකි. එබැවින් එය දුටු පමණින් 'මේ මහත් වූ ඇතෙකැයි' නිගමනය නො කරයි. ඒ ඇත් පිය වාමනිකා නම් ඇතින්නකගේ බව දනියි (වාමනිකා නාම හත්ථියො මහාපාදා). හෙතෙම ඉදිරියට යන්නේ තවත් එබඳුම ඇත් පියක් දකියි. එහෙත් එය ද මහත් වූ ඇතෙකැයි නිගමනය නො කරයි. එය උච්චා කාලාරිකා නම් ඇතින්නගේ බව දනියි. ඉදිරියට යන ඔහුට තවත් ඇත් පියක් හමුවන අතර, එය ද මහත් වූ ඇතෙකුගේ බව නිගමනය නො කරයි. එම ඇත් පිය උච්චා කණේරුකා නම් වූ ඇතින්නගේ බව දනියි. ඉදිරියට යන හෙතෙම දික් වූ, පුළුල් වූ, මහත් වූ ඇත් පිය දකියි. ගස්වල උසින් පිට ඉලූ තැන් ද දකියි. දළින් සිඳ අතු ද, උසින් බිඳි අතු ද දකියි. හෙතෙම ඒ මහ ඇතුම බව අවබෝධ කර ගනියි (අයමෙව සො මහානාගොති). (එම, 434).

බුදුන් වහන්සේගේ ධර්මය ශ්‍රවණය කරන ඇතැම් කෙනෙක් ගිහිගෙයින් නික්ම සසුන් ගතව උතුම් ආර්ය මාර්ගයේ නියුතුවන්නෝ වෙති. උතුම් නිවන් මග අරමුණු කරගත් ඔහු සියලු අකුසලයන්ගෙ න් වැළකුනේ වෙයි. එසේ ක්‍රියාකරන ඔහු පඤ්චනීවරණ ධර්මයන් ප්‍රහීණ කරයි. එසේ ම ඔහු රූපාවචර ධ්‍යාන සතර ද, ඉක්බිතිව පුබ්බේනිවාසානුස්සති, චුතූපපාත, ආසවක්ඛය යන ඥාණයන් අරමුණු කරගෙන කටයුතු කරයි. එයින් නොනවතින ඔහු චතුරාර්ය සත්‍යාවබෝධය පිණිස කටයුතු කරයි. චතුරාර්ය සත්‍යාවබෝධය ලබන ඔහු බුදුන් වහන්සේ ද, උන්වහන්සේගේ ධර්මය ද, ආර්ය සංඝයා ද

දකියි. ඔහු තුළ පවත්නා කාම, භව, අවිජ්ජා යන ආශ්‍රවයන් ක්‍ෂය කළේ වෙයි. අවසානයේ ඔහුට මිදුනෙමි යැයි යන විමුක්ති ඥාණය ඇති වෙයි. ඔහුගේ සෙවීම එතනින් නතර වෙයි.

මෙසේ බුදුන් වහන්සේ ඇත් පියවර සොයන්නා ක්‍රමක්‍රමයෙන් ඒ ඒ ඇත් පියවර හඳුනාගන්නාක් මෙන් ආර්ය ශ්‍රාවකයා ඒ ඒ අවස්ථාවන්හී බුදුසසුනේ ඵලයන් ලබාගනියි. අවසානයේ ආර්ය මාර්ග යේ නිෂ්ටාවට පත්වෙන අතර, ඒ උතුම් නිවන අවබෝධ කරගැනීම බව සූත්‍රය අවසානයේ දැක් වේ.

සාරිපුත්‍ර හිමියන්ගේ දේශනාවක් වන මහාහත්ථිපදොපම සූත්‍රය චතුරාර්ය සත්‍යයේ විශිෂ්ටත්වය පිළිබඳ කරුණු ඇතුළත් සූත්‍රයකි. මෙය ද ඇත් අඩි උපමා කර ගනිමින් කරුණු විස්තර කරන හෙයින් ද, ඇත් අඩි උපමා කරගෙන දේශිත දෙවන සූත්‍රය බැවින් ද මෙය මෙනමින් හඳුන්වන්නට ඇත.

පොළොවෙහි හැසිරෙන්නා වූ පා සහිත සතුන්ගේ පාදයන් ඇත් පාදයට ඇතුළත් කළ හැකි ය. එසේ කළ හැකි වන්නේ ඇත් පාදය විශාල බැවිනි. එපරිද්දෙන් යම් කුසල ධර්මයක් වේ ද, ඒ සියල්ල චතුරාර්ය සත්‍ය සංග්‍රහයට ඇතුළත් කළ හැකි ය.

''සෙය්‍යථාපි ආවුසො යානි කානිචි ජඞ්ගලානං පාණානං පදජාතානි සබ්බානි තානි හත්ථිපදෙ සමොධානං ගච්ඡන්ති, හත්ථිපදං තෙසං අග්ගමක්ඛායති යදිදං මහන්තත්තෙන, එවමෙව ඛො ආවුසො යෙ කෙචි කුසලා ධම්මා සබ්බෙ තෙ චතුසු අරියසච්චෙසු සඞ්ගහං ගච්ඡන්ති.'' (එම, 448).

සූත්‍රයෙහි මීළඟට හමුවන උපමාව ආපෝ ධාතුවේ අනිත්‍යතාවය පෙන්වනු ලබයි. මහ මුහුදෙහි ජලය සත්තලක්, සතලක්, පස්තලක්, සිවුතලක්, තුන්තලක් සිටින කාලයක් වෙයි. එමෙන් ම මහ මුහුදෙහි පුරුෂ ප්‍රමාණ සතක්, සයක්, පසක්, සතරක්, තුනක්, දෙකක්, ප්‍රමාණයක් ජලය සිටින කාලයක් ද වේ. එමෙන් ම මහ මුහුදෙහි ජලය අර්ධ පුරුෂ ප්‍රමාණයක්, කටිය පමණ, දණ පමණ, ගොප් ඇටය පමණ, ඇඟිලි පුරුක තෙමෙන පමණට සිටින කාලයක් ද වේ. එපරිද්දෙන් බාහිර ආපෝ ධාතුවේ අනිත්‍යතාවය ද වන්නේ ය.

මහ මුහුද යනු සාරභාර වස්තුවක් ය. එය ද විපරිණාමයට පත්වන බව යථෝක්ත උපමාවෙන් පැහැදිලි වේ.

හොති බො ආවුසො සමයො යං මහාසමුද්දො සත්තතාලම්පි උදකං සණ්ඨාති, ඡතාලම්පි උදකං සණ්ඨාති, පඤ්චතාලම්පි උදකං සණ්ඨාති, චතුතාලම්පි උදකං සණ්ඨාති, තිතාලම්පි උදකං සණ්ඨාති, ද්විතාලම්පි උදකං සණ්ඨාති, තාලම්පි උදකං සණ්ඨාති.... හොති බො ආවුසො සමයො යං මහාසමුද්දො අඞ්ගුලිපබ්බතෙමනමත්තම්පි උදකං න හොති. තස්සා හි නාම ආවුසො බාහිරාය ආපෝධාතුයා තාව මහල්ලිකාය අනිච්චතා පඤ්ඤායිස්සති. (**එම, 454**).

රූපය යනු කුමක් දැයි පැවසීම සඳහා ද අලංකාරවත් උපමාවක් මෙහි දී භාවිතයට ගෙන ඇති අයුරු දැක ගත හැකි ය. දැව නිසා, වැල් නිසා, තණ නිසා, මැටි නිසා ගෙය යැයි ව්‍යවහාර කෙරේ ද, එපරිද්දෙන් ඇට නිසා, නහර නිසා, මස් නිසා, සම නිසා රූපය යැයි කියනු ලැබේ.

සෙය්‍යථාපි ආවුසො කට්ඨඤ්ච පටිච්ච වල්ලිඤ්ච පටිච්ච තිණඤ්ච පටිච්ච මත්තිකඤ්ච පටිච්ච ආකාසො පරිවාරිතෝ අගාරන්තෙව සඞ්ඛං ගච්ඡති, එවමෙව බො ආවුසො අට්ඨිඤ්ච පටිච්ච නහාරුඤ්ච පටිච්ච මංසඤ්ච පටිච්ච ආකාසො පරිවාරිතො රූපන්තෙව සඞ්ඛං ගච්ඡති. (**එම, 458**).

මෙම උපමාවන්ට අමතරව කකචූපම උපමාව ද මේ සූත්‍රයේ දැක ගත හැකි ය. ඒ අනුව බලන කළ මහාහත්ථිපදෝපම සූත්‍රය කකචූපම සූත්‍රයට පසුව දේශිත සූත්‍රයක් යැයි සිතිය හැක.

දෙව්දත් තෙරුන්ගේ චරිතය ඇසුරු කරගෙන අනෙක් භික්ෂූන් උදෙසා බුදුන් වහන්සේ විසින් මහාසාරොපම සූත්‍රය දේශනා කරන ලදි. ගසක සාරය ගෙන කරුණු දේශිත බැවින් මෙය මහාසාරෝපම වශයෙන් නම් කොට ඇත. ශාසනික බ්‍රහ්මචර්යාවේ යෙදෙන භික්ෂුවක් එහි හරය අවබෝධ කොට ගත යුතු ය. එසේ නොමැතිනම් එහි සාරය යැයි කියා වැරදි අත්කරගන්නෙක් විය හැකි ය. ඒ අනුව ලාභසත්කාර ලැබීමේ ආදීනවත්, භික්ෂු ජීවිතයේ සැබෑ අරමුණත් මෙම සූත්‍රයෙන් ප්‍රකාශිත ය.

සසුන් ගතවන ඇතැමෙක් ලාබ සත්කාර කෙරෙහි ගිජු වී ප්‍රධාන අරමුණ අමතක කරති. ඔහු තමාට ලැබෙන ලාබ සත්කාර පමණක් ගැන සිතා එයින් මානයට පත්වෙයි. එය ගසක සාරය සොයන පුද්ගලයෙක් ඒ ගසේ සාරවත් කොටස හැරදමා සාරය යැයි සිතා ගසේ කොළ හා පොතු අරගෙන යන්නාක් මෙනි.

ඇතැම් කෙනෙක් සසුන් ගත වී හුදෙක් සීල සම්පත්තියෙහි පිහිටා කටයුතු කරති. එසේ කටයුතු කරන ඔහු ලාබ සත්කාරවලින් මානයට පත් නොවී තම සීලය නිසා මානයට පත්ව අන්‍යයන් හෙළාදකිති. එය ගසක සාරය සොයන පුරුෂයෙකු සාරය යැයි සිතා ගසේ පොත්ත ගෙන යන්නාක් වැනි ය.

ඇතැම් කෙනෙක් උතුම් පරමාර්ථ ඇතිව සසුන් ගත වී සමාධියට පත්වෙති. සීලයෙන් මානයට පත් නොවී සමාධියට පත්වන ඔහු අන්‍යයන් හෙළාදකිති. සමාධියට පත් නොවීම ඔවුන්ගේ දුර්වලකම් වශයෙන් දොස් නගමින් තමා පමණක් එබඳු සමාධියක් ඇතියෙක් යැයි සළකාගෙන කටයුතු කරති. එය ගසක සාරය සොයන්නකු හරය යැයි සිතා ගහේ සිවිය රැගෙන යන්නාක් වැනි ය.

ඇතැමෙක් සීලයට, සමාධියට පත්ව එයින් මානයට පත් නොවී ඤාණ දර්ශනයට පත්වෙති. ඔහු ඒ පිළිබඳව මානය උපදවා අන්‍යයන් හෙළා දකියි. එය ගසක සාරය සොයන්නකු ගසේ එලය සාරය යැයි සිතා රැගෙන යන්නාක් වැනි ය.

ඇතැමෙක් සසුන් ගතව සීල, සමාධි, ප්‍රඥාවන්ට පත්ව එයින් මානයට පත් නොවී කටයුතු කරති. ඔවුහු තම සසුන් ගතවීමේ අරමුණ සාක්‍ෂාත් කරගත්තෝ වෙති. එය ගසක සාරය සොයන්නකු කොල හෝ පොත්ත හෝ සිවිය හෝ එලය හෝ නොගෙන එහි සාරයම ගෙනයන්නාක් මෙනි.

සූත්‍රය අවසානයේ දී බුදුන් වහන්සේ දේශනා කරන්නේ බුද්ධ ශාසනයට ඇතුළත් වන්නන්ගේ අරමුණ විය යුත්තේ රහත් භාවය ලබා ගැනීමයි. එයින් මෙහා ඇති සීල, සමාධි, ප්‍රඥා, ඥානදර්ශනාදිය නො වේ. රහත් බව බුදුදහමේ සාරය වශයෙන් ද, එය පරම නිෂ්ඨාව වශයෙන් ද සැළකිය යුතු බවයි.

ඉති ඛො භික්ඛවෙ නයිදං බ්‍රහ්මචරියං ලාභසක්කාරසිලොකානිසංසං, න සීලසම්පදා නිසංසං, න සමාධිසම්පදානිසංසං. යා ච ඛො අයං භික්ඛවෙ අකුප්පා චෙතොවිමුත්ති, එතදත්ථමිදං භික්ඛවෙ බ්‍රහ්මචරියං එතං සාරං එතං පරියොසානන්ති. (එම, 476).

ඕපම්ම වග්ගයේ අවසන් සූත්‍රය වන චූලසාරොපම සූත්‍රය පිංගලකොච්ඡ නම් බමුණෙක් ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලද්දකි. ඔහු බුදුන් වහන්සේගෙන් ෂට් ශාස්තෘන්ගේ දැනුම පිළිබඳ කරුණු විමසති. මෙම සූත්‍රයේ ද දැක ගත හැකිවන්නේ මහාසාරෝපම සූත්‍රයේ උපමාවම ය.

බුදුන් වහන්සේ ඔවුන්ගේ දැනුමේ පරිමාව පිළිබඳ කරුණු විමර්ශනය කරන්නට යන්නේ නැත. මෙය බුදුන් වහන්සේ තුළ දක්නට ඇති විශේෂත්වයකි. තම ධර්මය ම විශිෂ්ට වශයෙන් ගෙන වාද විවාද කරන ඇතැම් ශාස්තෘවරු සිටියදී බුදුන් වහන්සේ ඔවුන් පිළිබඳ කරන විවේචනය වෙනුවට වඩාත් වැදගත් වූ යථාර්ථය පෙන්වීමට උත්සුක වෙයි. මහාසාරෝපම සූත්‍රයේ මෙන් ම කරුණු කරුණු විස්තර කරන බුදුන් වහන්සේ ඥාණ දර්ශනයට වඩා උත්තරීතර දර්ශනයක් ඇති බව දේශනා කරයි. එය මහාසාරෝපම සූත්‍රයට අතිරේක වූවකි. එම කරුණු නම් රූපාවචර ධ්‍යාන හතර හා අරූපාවචර ධ්‍යාන හතරයි. සඤ්ඤාවේදයිත නිරෝධයට පත්වන ඔහු සියලු ආශ්‍රවයන් ප්‍රහීණ කොට උත්තරීතර විමුක්තියට පත්වෙයි. මෙය බුදුසමයේ උතුම් හරය අවබෝධ කර ගැනීමයි. එය ගසක සාරය සොයන්නකු එහි නියම සාරය ම ඉවතට ගැනීම වශයෙන් බුදුහු අවධාරණය කරති.

සෙය්‍යථාපි සො බ්‍රාහ්මණ පුරිසො සාරත්ථිකො සාරගවේසි සාරපරියෙසනං චරමානො මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො සාරඤ්ඤේව ඡෙත්වා ආදාය පක්කන්තො සාරන්ති ජානමානො, යඤ්චස්ස සාරෙන සාරකරණීයං තඤ්චස්ස අත්ථං අනුභවිස්සති. තථූපමාහං බ්‍රාහ්මණ ඉමං පුග්ගලං වදාමි. (එම, **492**).

එනයින් බලන කල ධර්මයේ ගැඹුරු තැන් වඩාත් පහසුවෙන් තම ශ්‍රාවකයින්ට අවබෝධ කරලීම

**නිගමනය**

ඕපම්ම වග්ගයේ සූත්‍රයන්හි අලංකාරවත් උපමා උපමේයයන් භාවිත කරමින්, සාහිත්‍ය රසය ද උද්දීපනය කරමින් බුදුන් වහන්සේට ශ්‍රාවකයන්ට ඒත්තු ගැන්වීමට අවශ්‍ය කරුණු අවශ්‍ය ආකාරයෙන් ම සිදු කළ ඇති ආකාරය දැක ගත හැකි ය. ඒ අනුව පඨමසම්බෝධි සමයේ සිටි භික්ෂූන්ගේ හික්මීම, මෙත්සිතක ඇති වටිනාකම, ධර්මය වැරදියට ග්‍රහණය කිරීමෙන් ඇතිවන ආදිනව, ධර්මය නිවැරදිව ග්‍රහණය කිරීමෙන් ඇති ප්‍රයෝජන, සංසාර සාගරයෙන් එතෙර වූ පසු ධර්මය ද අත්හැරිය යුතු බව පැවසීමෙන් අත්හැරීමේ උදාරත්වය, වීර්යයෙන් යුක්තව, පසුබැසීමෙන් තොරව සංසාරික දුක්ඛ දෝමනස්සයන්ට තාරණ වූ අසාර ධර්මතාවයන් එකිනෙක ඉක්මවා ගොස් අර්හත්වය ලබාගන්නා අයුරු, සප්ත විශුද්ධිය එකින් එක් අත්හරිමින් අනුපාදාපරිණිර්වාණය දක්වා ම ගමන් කරන අයුරු, පඤ්චකාම ගුණයන්හි ඇලීමේ ආදිනව හා නො ඇලීමේ ප්‍රයෝජන, බුද්ධත්වයට පත් වී ධර්මය දේශනා කිරීමේ වැදගත්කම, පැවිදි බව ලබන තැනැත්තා අර්හත්වය කරා ගමන් කරන ආකාරය, සියලු කුසල ධර්මයන් චතුරාර්ය සත්‍යයට ඇතුළත් කළ හැකි ආකාරය, බුද්ධ දේශනාවේ හරය ලාබ සත්කාර, සීලය, සමාධිය, ප්‍රඥාව හා ඥාණ දර්ශනය නොව රහත් බවයි යන්න තම ශ්‍රාවකයින්ට අවබෝධ කරනු පිණිස බුදුන් වහන්සේ අලංකාරවත් උපමාවන් භාවිත කර ඇත. ඉහත කරුණු දෙස බැලූ විට ගම්‍යවන කාරණය වන්නේ ධර්මයේ වැදගත් ඉගැන්වීම් පහසුවෙන් ම බුදුන් වහන්සේ තම ශ්‍රාවකයින්ට අවබෝධ කළ බවයි. බුදුන් වහන්සේට අමතරව සැරියුත් හිමියන්, පුණ්ණ හිමියන්, වච්චායන හිමියන් ද තම ධර්මය දේශනා කිරීම පිණිස උපමා භාවිත කර ඇති අයුරු රථවිනීත, චුල්ලහත්ථිපදෝපම, මහාහත්ථිපදෝපම ආදි සූත්‍රයන්ගෙන් පිළිඹිබු වේ. එමෙන් ම බොහෝ උපමාවන් ආරම්භ වනුයේ 'සෙය්‍යථාපි' යන වචනයෙනි. බාහිර ලෝකයේ ඇති ලෞකික වස්තූන් උපමාවන්ට ගැනීමෙන් විශද වන්නේ බුදුන් වහන්සේ තුළ පැවති ඥානයේ සුවිශේෂත්වයයි. බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලද ගැඹුරු ධර්ම කරුණුවල අර්ථ ග්‍රහණය කරගැනීමෙහිලා වැදගත් සාධකයක් ලෙස උපමා භාවිතය පෙන්වා දිය හැකි ය. එය බුදුන් වහන්සේගේ උපමා භාවිතය තුළ ඇති සුවිශේෂත්වයයි. ඒ බව සූත්‍රාවසානයේ භික්ෂූන් සතුටු සිතින් ධර්මය පිළිගත් බව සඳහන් වීමෙන් ගම්‍යමාන වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය

**අංගුත්තර නිකාය** 5 (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර් මුද්‍රණය, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**මජ්ඣිම නිකාය** 1 (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර් මුද්‍රණය, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**සංයුත්ත නිකාය** 5 (2) (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර් මුද්‍රණය, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**සුත්තනිපාත** (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර් මුද්‍රණය, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

### ද්විතීක මූලාශ්‍රය

එල්ලාවල හිමි (සංස්) (1936). **ප්‍රපඤ්ච දීපිකා නම් වූ පපඤ්චසූදනී මජ්ඣිමනිකායට්ඨකථා** (සිංහල අනුවාදය)........

චන්දිම හිමි, පනාමුරේ (2019). '**ධර්ම විශ්ලේෂණයේ දී උපමා භාවිතය: මජ්ඣිම නිකායේ ශ්‍රාවක භාෂිත දේශනා ඇසුරෙන් කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්**.' *ප්‍රවචන* 10 (1), 24-33 පිටු.

ධම්මානන්ද හිමි, මකුරුප්පේ (2009). *ව්‍යාඛ්‍යා* **විවරණ සහිත මජ්ඣිම නිකාය: ඔපම්ම වග්ගය**, කතෘ ප්‍රකාශනයකි.

ධර්මකීර්ති හිමි, නිවන්දම, විමලරතන හිමි, නාරම්පනාව, කීර්ති (2017). **සිංහල මජ්ඣිම නිකාය 1**, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

පියරතන හිමි, වල්මොරුවේ (2003). '**මජ්ඣිම නිකායේ ඕපම්ම වග්ගයේ අන්තර්ගත සූත්‍ර පිළිබඳ කෙටි විවරණයක්**.' *නැණස*, 1-22 පිටු.

මේධානන්ද හිමි, දේවාලේගම (2013). **බෞද්ධ අධ්‍යයන ලිපි**, කොළඹ: දයාවංශ ජයකොඩි සහ සමාගම.